2013.04.02

දිස්ත්‍රික් ලේකම් / දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

සහකාර සමෘද්ධි කොමසාරිස්/දිස්ත්‍රික් නියෝජ්‍ය අධ්‍යක්ෂ,

දිස්ත්‍රික් සම්බන්ධිකරන නිළධාරි,

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය,

.............................

## දිවිනැගුම අවුරුදු පොළ පැවැත්වීම 2013

යතෝක්ත කරුණ සම්බන්ධව අංක ස/අධි/15/7 හා 2013.03. මග පෙන්වීම් ලිපියට වැඩිමනක් වශයෙනි.

මේ වන විට ඔබ දිස්ත්‍රික්කයේ සියලු ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ ආවරණය පරිදි දිවිනැගුම අවුරුදු පොල අප්‍රේල් මස 5 වන දින සිට 12 වන දින දක්වා පැවැත්වීමට කටයුතු සැලසුම් කර ඇති බව වාර්තා වි ඇත. මෙම අලෙවි පොලවල් පැවැත්වීමේ දි පහත සදහන් පරිදි කටයුතු කරන මෙන් අදාල නිළධාරින්ට උපදෙස් ලබාදෙන මෙන් කාරුණිකව දන්වමි.

01. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ උපදෙස් පරිදි දිවිනැගුම අවුරුදු පොළවල් සඳහා රාජ්‍ය ආයතන වලට නියෝජනයක් ලබා දි ඇති අතර එම ආයතන වලින් වෙළද කුටි සඳහා මුදලක් අයකර නොගත යුතුය.

02. ශ්‍රි ලංකා සමෘද්ධි අධිකාරිය මුලිකත්වය ගෙන සංවිධානය කරන අවුරුදු පොල පැවැත්වෙන භූමියේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය හා ශ්‍රි ලංකා සමෘද්ධි අධිකාරියේ අනන්‍යතාවය ප්‍රදර්ශනය වන පරිදි බැනර හා වෙනත් සුදුසු ක්‍රම යොදාගැනිම කල යුතුය.

03. මෙම අවුරුදු පොල භූමියේ ජංගම සමෘද්ධි බැංකුවක් ස්ථාපනය කර ප්‍රතිලාභින්ට ගණුදෙණු කිරිමේ අවස්ථාව සලසා දිය යුතුය.

04. අවුරුදු පොල සඳහා එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයක් සඳහා අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මේ වන විටත් ලබා දි ඇති අතර එම මුදල් වලට අමතරව දැනට කොට්ඨාශ මට්ටමේ ඇති අලෙවි පොළ චක්‍රිය අරමුදල ද මේ සඳහා යොදාගත හැක. මෙම අලෙවි පොළ චක්‍රිය අරමුදල වර්ධනය කිරිම සඳහා යම් සාධාරන මුදලක් පොළට සහභාගිවන පෙ ද්ගලික ව්‍යවසායකයින්ගෙන් අයකරගත යුතුය.

05. දිස්ත්‍රික්කයේ පවත්වන විශේෂ පොළවල් සඳහා වන අනුමැතිය සමෘද්ධි අධිකාරිය වෙත යොමුකර ලබාගත යුතුය.

අවුරුදු පොල සාර්ථක කර ගැනිමට ඔබ ඇතුලු කාර්ය මණ්ඩලයෙන් ලැබෙන සහයෝගය ඉතා අගයකොට සලකමි.

ආර්.පි.බි. තිලකසිරි,

අධ්‍යක්ෂ ජනරාල්.

පිටපත - ප්‍රියන්ත මායාදුන්නේ මහතා, අතිරේක ලේකම් ආයෝජන - කාරුණික දැන ගැනිම සඳහා